# නාලන්දා, වලභී බෞද්ධ විශ්වවිද්‍යාල සහ ඊට අනුබද්ධ පුස්තකාල

එච්. එම්. ඉසුරු හේරත්[1], සජානි තෙන්නකෝන්[2], තක්ෂිලා සෙනෙවිරත්න[3]

## හැඳින්වීම

පුරාතනයේ සිට වර්තමානය දක්වා වූ දීර්ඝ කාලසමය තුළ ලොවපුරා විවිධාකාර ආගමික - අනාගමික පුස්තකාල ප්‍රභවය විය. ඒ අතර ක්‍රි.පූ. 3 සියවසේ උතුරු අප්‍රිකාවේ ඊජිප්තුවේ පැපිරස් සහ වේලම් පිටපත් 700000 සමන්විතව පැවති ඇලෙක්සැන්ඩ්‍රියා මහා පුස්තකාලය, පැරණි රෝම අධිරාජ්‍යයේ ඔක්ටාරියන් රාජකීය පුස්තකාලය, ක්‍රි.ව. 7 මොරොක්කෝවේ ඉදිවුණ ඉස්ලාම් අල් - කවාරින් පුස්තකාලය, චීන අධිරාජ්‍යයේ රාජකීය වාර්තා තැම්පත් කළ පුස්තකාල, ශ්‍රී ලංකාවේ ඉපැරණි ආගමික අනාගමික පොත්ගුල්, ඉන්දියාවේ හින්දු ආගමික සරස්වතී භාණ්ඩාගාර නම් පුස්තකාල මෙහිදී සිහියට නැගෙයි. මෙම අගනා පුස්තකාල නාමාවලියට මධ්‍යකාලීන ඉන්දියාවේ ක්‍රි.ව. 5 සියවසේ ප්‍රභවය වූ නාලන්දා, වලභි නම් වූ බෞද්ධ විශ්වවිද්‍යාලවලට අනුබද්ධ බෞද්ධ පුස්තකාලවලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මෙම ලිපිය මගින් මධ්‍යකාලීන ඉන්දියාවේ ප්‍රභවය වූ බෞද්ධ විශ්වවිද්‍යාල සහ ඊට අනුබද්ධ බෞද්ධ පුස්තකාල පිළිබඳ සහ ඒවායේ ව්‍යුහය පිළිබඳ පරීක්ෂා කිරීමට අපේක්ෂිතය. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි. ඒ අනුව ප්‍රස්තුතයට අදාල ප්‍රාථමික සහ ද්වීතියික දත්ත තුලනාත්මකව අධ්‍යයනය කර නිගමනය කරා එළැඹිණි.

## නාලන්දා, වලභි යනාදී බෞද්ධ විශ්වවිද්‍යාලවලට හා ඊට අනුබද්ධ පුස්තකාල

බිහාර් ප්‍රාන්තයේ රාජගෘහ (රාජගීර්) සිට සැතපුම් කීපයක් දුරින් පිහිටි බාගෝන් (Bargoan) නම් ගමෙහි නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලය සහ තදානුබද්ධ පුස්තකාල ජාලය පිහිටා ඇත. ශත වර්ෂයකට පෙර භික්ෂු ආරාමයක් වශයෙන් පැවති නාලන්දාව ක්‍රි.ව. 6 සියවසේදී ෆාහියන් සහ යුවැන්චුවැන්ග් අතර කාලයේදී විශ්වවිද්‍යාලයක් වශයෙන් ප්‍රසිද්ධත්වයේ ඉහළට ගියේය. මෙම විශ්වවිද්‍යාලයට ස්වල්ප දුරකින් පාල වංශික රජවරු ක්‍රි.ව. 7 වික්‍රමශීලා බෞද්ධ විශ්වවිද්‍යාලය ආරම්භ කිරීමෙන් පසුව තරමක් පසුබැවද, ක්‍රි.ව. 1197 මහමදිකයන් විනාශ කරන තුරු පැවතීමට නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලය සහ ඊට අනුබද්ධ පුස්තකාල ජාලයට හැකිවිය. පුරාවිද්‍යාඥයන් විසින් කැණ ලබාගත් පුරාවස්තු එහිම කෞතුකාගාරයක තැන්පත් කොට තිබේ. මෙහිදී අනාවරණය කරන ලද පුරාවස්තු අතර එහි නිල මුද්‍රාව වැදගත් වෙයි. එනම් ධර්ම චක්‍රය සහ එහි දෙපස සිටින මුවන් දෙදෙනාගේ ලාංඡනයයි (බාපත්, 2011). එහි නාලන්දා මහා විහාරයේ ගරු භික්ෂූන් යනුවෙන් අදහස්වන පාඨයක් කැටයම් කොට තිබේ. ක්‍රි.ව. 7 සියවස වන විට ගෘහ නිර්මාණ ශිල්පය අතින් වැදගත්ම ආයතනය වූයේ නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලයයි. විශ්වවිද්‍යාලය සහ එයට අනුබද්ධ පුස්තකාලයට අවට පරිසරය අලංකාරවත් පොකුණු සහිත මල්වතුවලින් සමන්විත වූ බව දේශාටන

1 සහකාර පුස්තකාලයාධිපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය. isuruhistory@gmail.com
2 සහකාර පුස්තකාලයාධිපති, විවෘත විශ්වවිද්‍යාලය. sajanithennakoon1@gmail.com
3 ස්වාධීන පර්යේෂිකා, thakshilasmadushani@gmail.com

වාර්තා සාක්ෂි දරයි (බාපත්, 2011: 230). පළමුවන කුමාරගුප්ත රජු විසින් ඉදි කළ විහාරය පදනම කොටගෙන බිහිවූ නාලන්දා විශ්වවිද්‍යාලීය වපසරිය 1.6×0.8 නප පැතිරී තිබුණ අතර ගුරුවරු 1500ක් ඉගැන්වීමෙන් ද සිසුන් 10000-15000 අතර ප්‍රමාණයක් උසස් අධ්‍යාපනය ලැබූහ. මෙම බෞද්ධ විශ්වවිද්‍යාලවල ඉගෙනීමට සහ විශ්වවිද්‍යාල අනුබද්ධ පුස්තකාලවල මගින් පරිශීලනය කිරීම සඳහා පැමිණෙන අපේක්ෂකයන්ට විශ්වවිද්‍යාල දොර අසල ද්වාර පරීක්ෂණයකට මුහුණ දීමට සිදු විය. එයින් සමත් වන අයවලුන්ට පමණක් පුස්තකාලය පරිශීලනය කළ හැකි විය (බාපත්, 1973:94). නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාල පුස්තකාලයේ ලක්ෂ ගණනක අත් පිටපත් සම්භාරයක් පැවති බවට ක්‍රි.ව. 17-18 සියවස්වල නාරානාථ විසින් රචිත ටිබෙට් ඉතිහාසය කෘතියේ අන්තර්ගත වෙයි. ටිබෙට් වාර්තාවලට අනුව විශ්විද්‍යාලයේ ධම්ම ගඤ්ඤ විශාල භූමි කොටසක පුස්තකාල සඳහා වෙන්කොට තිබූ අතර එකී පුස්තකාල ත්‍රිත්වය නම්

- රත්නදධී (මැණික් මුහුද)
- රත්නසාගර (මැණික් සාගරය)
- රත්නරන්ජන (මැණික් වලින් කරන ලද) යනාදියයි.

මෙම පුස්තකාල අතුරින් රත්නදධී නම් වූ ප්‍රධාන පුස්තකාලය මහල් හතකින් සමන්විත වූ බව සඳහන් වෙයි (බාපන්, 2011: 241). ටිබෙට් මූලාශ්‍රවලට අනුව භක්තියාර් බල්ජි ප්‍රමුඛ තුර්කි මුස්ලිම්වරු මෙම විශ්වවිද්‍යාල පුස්තකාල ජාලය ගිනිතබා විනාශකොට තිබේ. නාලන්දා පුස්තකාල ජාලයේ තැන්පත් කොට තිබූ විවිධ විෂයානුබද්ධ කෘති අතර,

- දර්ශනය
- තාරකා විද්‍යාව
- තර්ක ශාස්ත්‍රය
- ව්‍යාකරණය
- බ්‍රහ්මණාගම
- බුද්ධ ධර්මය
- සාහිත්‍ය
- වෛද්‍ය විද්‍යාව
- ගුප්ත ශාස්ත්‍රය
- ගෘහ නිර්මාණ ශිල්පය
- කාම ශාස්ත්‍රය

- ලලිත කලා
- චිකිත්ස
- ඉතිහාසය
- යෝග දර්ශනය
- ගණිතය
- නක්ෂත්‍රය
- කාව්‍ය ශාස්ත්‍රය

යනාදී කෘති වැදගත් වෙයි. මෙම ග්‍රන්ථ ඇතුලත් පුස්තකාලය නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලයේ හදවත විය. මෙම නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාල අනුබද්ධ පුස්තකාල පරිශීලනය කිරීමෙන් කීර්තියට පත් දෙස් විදෙස් උගතුන් අතර ආර්යදේව, පාණිනී, ඉත්සිං, හියුංසාන් යනාදීහු වැදගත් වෙයි (තාපර්, 1973: 94). දේශන, සාකච්ඡා සහ පොත් පරිශීලනය කිරීම සඳහා මෙහි ආසන හෝ පුටු 100 පමණ පිළිවෙලකට සංවිධානය කොට තිබීමට තරම් නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලය සහ එහි පුස්තකාලය පොහොසත් විය. පෙර දැක්වූ විෂයයන්ට අමතරව වේද, හේතු විද්‍යා, ශබ්ද විද්‍යා, වශීකර්මය වැනි ලෞකික පොතපත ද මෙම නාලන්දා පුස්තකාලයේ පැවතිනි (බාපත්, 2011: 239). සූත්‍ර සහ ශාස්ත්‍ර සංග්‍රහයන් 20ක් තේරුම් කිරීමට සමතුන් 1000ක් ද 30ක් තේරුම් කර දිය හැකි සමතුන් 500ක් ද සංග්‍රහයන් 50ක් තේරුම් කර දිය හැකිය. නීතිය පිළිබඳ ප්‍රධානියා ඇතුළු දසදෙනෙක් වන අතර මේවා සියල්ල කියවා වටහාගත් තැනැත්ත සීලභද්‍ර තෙරුන් පමණක් විය. පාඨමාලාව නිමවෙද්දී ශිෂ්‍යයාගේ තත්ත්වය සහ සුදුසුකම් වලට අනුව අධ්‍යාපන උපාධි පිරිනැමේ. දෛනික කාලසටහන සකස් කරන ලද්දේ දිය බඳුනක් මඟින් තැණන ජල ගෝරා යන්ත්‍රයක් අනුසාරයෙන් සිදුරු කරන ලද කුඩා දිය බඳුනක් විශාල දිය බඳුනක බහා එම කුඩා දිය බඳුන එහිම පාවීමට ඉඩ හරියි. කුඩා දිය බඳුන පිරෙන්නට 1/4 ක් ගත වෙයි. එක් වරක් තට්ටු කිරීමෙන් පැය කාලක් ගත වූ බව හැඟිණි. සිසුන් හා ගුරුවරු දිනකට පැට 8 ඉගැන්වීම ඉගැන්වීම සහ පුස්තකාල පරිහරණය කළ යුතු විය (බාපත්, 2011: 241).

එමෙන්ම නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලය තුළ  සාකච්ඡා කණ්ඩායම් ක්‍රමය වඩාත් සාර්ථකව සිදු විය. කථා ක්‍රමය යනුවෙන් ද හැඳින්වූ මෙම අධ්‍යාපන ක්‍රමය දේශීයව පමණක් නොව විදේශීය භික්ෂූන් ආකර්ෂණය වන්නක් විය. එනම්,

**''ඉගෙනීමට හා සාකච්ඡාවලට ඔවුන්ට දවස් මදිවිය.''**

යනුවෙන් මෙම නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලයේ කාර්යභාරය පිළිබඳව නූතන උගතෙකුගේ ප්‍රකාශනයක් (බාපත්, 2011: 241). මෙසේ නාලන්දාවේ පමණක් නොව අනෙකුත් අධ්‍යාපන ආයතනවලට මෙම සාකච්ඡාවලට බෞද්ධ චින්තනය කලාව සංස්කෘතිය පැරණි භාරත සංස්කෘතික ඉතිහාසය වැනි විෂය ක්ෂේත්‍රයන් මාතෘකා විය. මෙම සංවාද කිරීම සඳහා සිසුන් අනිවාර්යයෙන් පුස්තකාල පරිශීලනය කරන්නට

ඇත (බාපත්,2011:241). නාලන්දා බෞද්ධ විශ්වවිද්‍යාලයේ භාවිත කළ භාෂාව වූයේ සංස්කෘතයි. විශේෂයෙන්ම චීනයෙන් පැමිණ ඉත්සිං නම් තෙරණුවෝ නාලන්දාවේ වසර කීපයක් නේවාසිකව අධ්‍යාපනය හදාරා ශ්ලෝක 500000 සමන්විත ග්‍රන්ථ 400 ආපසු චීනයට ගෙනගිය බව සඳහන් වෙයි. ඉන්දියාවේ පැවති එකම ථේරවාදී බෞද්ධ විශ්වවිද්‍යාලය සහ එකම ථේරවාදී ඉන්දීය බෞද්ධ පුස්තකාලය වන්නේ ගුජරාටයේ සෞරාෂ්ත්‍ර අර්ධද්වීපය පැවති බෞද්ධ විශ්වවිද්‍යාලය සහ තදානුබද්ධ පුස්තකාලයයි. ක්‍රි.ව. 5-7 සියවසේ ආරම්භය මෙම විශ්වවිද්‍යාලයේ වලභ ථේරවාදී බෞද්ධ ආරාමය මුල් කොටගෙන ආරම්භ වූ හෙයින් වලභි ථේරවාදී බෞද්ධ විශ්වවිද්‍යාලය නමින් ප්‍රචලිත විය. නාලන්දා මහායාන බෞද්ධ විශ්වවිද්‍යාලය තරම් සංවිධානාත්මක සැකැස්මෙන් සහ ප්‍රභූ ආධාරයෙන් තරමක් අඩු වුව ද 1000 වැඩි ගිහි-පැවිදි ගුරුවරු සහ ශිෂ්‍යයෝ නේවාසිකව මෙම විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපනය හැදෑරූහ. ධාරසේන, ධ්‍රැවසේන වැනි මෛත්‍රික වංශික රජවරු මෙම විශ්වවිද්‍යාලය සහ පුස්තකාලයට අනුග්‍රහය පල කළහ (පින්තු, මියාල්, 2002: 94). විශේෂයෙන්ම වලභි ථේරවාදී පුස්තකාලයේ

- නීතිය
- අර්ථ ශාස්ත්‍රය
- වෛද්‍ය ශාස්ත්‍රය
- බුද්ධ ධර්මය
- ව්‍යාකරණය
- දර්ශනය
- සාහිත්‍යය
- ඉතිහාසය
- නක්ෂත්‍රය
- පාලි භාෂාව
- සංස්කෘත

යන විෂය ක්ෂේත්‍රයට අයත් අගනා පොත්පත් තැන්පත් කොට පවතින එයිනුත් වලභි විශ්වවිද්‍යාලය වඩාත් ජනප්‍රිය වූයේ නීතිය, බෞද්ධ ධර්මය, අර්ථ ශාස්ත්‍රය සහ වෛද්‍ය විද්‍යාව ඉගැන්වෙන අගනා ථේරවාදී බෞද්ධ විශ්වවිද්‍යාලයක් ලෙසය (පින්තු, මියාල්, 2002: 94). මෙම අගනා විශ්වවිද්‍යාලය සහ පුස්තකාලය ක්‍රි.ව. 9 පසුව මහමදික ආක්‍රමණයන් විසින් ගිනිතබා විනාශ කරන ලදී.

**නිගමනය**

නාලන්දා, වික්‍රමශීලා, වලභි, ජගද්දලා, ඔදන්තපුරි යන මහායාන ථේරවාදී බෞද්ධ විශ්වවිද්‍යාල සහ ඒවාට අනුබද්ධ පුස්තකාලවලින් කාලීන ලෝකයේ දෙස්-විදෙස් දැනුම-පිහිසිත ගිහි-පැවිදි සිසුන්ට විධිමත් අධ්‍යාපනයක් ලබාදුන් බවටත් එසේ විධිමත් දැනුම් ලබාදීමට තරම් බෞද්ධ විශ්වවිද්‍යාලවල අනුබද්ධ පුස්තකාල මත සංවර්ධිත පැවති බවට මෙමඟින් නිගමනය කළ හැකිය. මීට අමතරව අනාගතයේ බෞද්ධ ආරාම සහ තදානුබද්ධ පුස්තකාල බිහිවීම උදෙසා මෙම නාලන්දා දී විශ්වවිද්‍යාල සහ පුස්තකාල උපකාරි වනු නිසැකය.

**ප්‍රමුඛ පද**- නාලන්දා, වලභි, ථෙරවාදී බෞද්ධ විශ්වවිද්‍යාල, අනුබද්ධ පුස්තකාල, ගිහි-පැවිදි සිසුන්

**ආශ්‍රිත ග්‍රන්ථ**


බාපති, පී. (2011). *දෙදහස් පන්සිය වසරක බොදු සමය*. නුගේගොඩ: සුනෙර ප්‍රකාශකයෝ.

පඤ්ඤාකිත්ති, හිරිපිටියේ. (2014). *ගුප්ත අධිරාජ්‍යයේ ඉතිහාසය*. කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ.

හේරත්, ඉසුරු. (2019). *භාරතීය අධිරාජ්‍යවාදය තොටිල්ල මගධය*. කඩවත: සාරංගා ප්‍රකාශන.

මියාල්, ක්වාෂියර්, පින්තු. (2002). *ඉතිහාස ධාරා*. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේතුව.

තාපර්, රෝමිලා. (1973). *ඉන්දියාවේ ඉතිහාසය*. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

රාවෝ, බී. ව. (1990). *ලෝක ඉතිහාසය*. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශක දෙපාර්තමේන්තුව.

හින්තැටිය, ශ්‍රී විමල කීර්ති, උදිත. (1989). *භාරතිය ධර්ම ශාස්ත්‍ර සහ සිංහල සිරිත් විරිත්*. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

හපුආරච්චි, අජන්තා. (2003). *මුද්‍රණ ශිල්පය ප්‍රභවය සහ පරිනාමය*. කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ.